www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ දරුනු සටන් උත්සන්න වෙයි

## Fierce fighting escalates in Sri Lanka

**කේ. රත්නායක විසිනි**
**2006 අගෝස්තු 2**

2002 දී සටන් විරාම ගිවිසුමක් අත්සන් කිරීමෙන් පසුව ප්‍රථම වතාවට, ශ්‍රී ලංකා සොල්දාදුවන් සහ දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ සටන්කරුවන්, පසු ගිය දින දෙක තිස්සේ විවෘත සටනක නියැලී ඇත. ජීවිත හානි පිලිබඳ වාර්තා පුලුල් ලෙස එකිනෙකින් වෙනස් වන අතර, තියුනු සටන් ජීවිත විශාල සංඛ්‍යාවක් බිලි ගෙන තවත් බොහෝ ගනනකට තුවාල සිදු කොට ඇත.

එල්ටීටීඊ ඉලක්කවලට දින හතරක් ගුවන් ප්‍රහාර එල්ල කිරීමෙන් පසුව, නැගෙනහිර පලාතේ වරාය නගරයක් වන ත්‍රිකුනාමලය අසල එල්ටීටීඊ භූමි ප්‍රදේශයක් තුල පිහිටි මාවිල්ආරු වාරි මාර්ග සොරොව්ව අල්ලා ගනු පිනිස, මිලිටරිය 3,000ක භට පිරිසක් යොදවා ගෙන ඉරිදා ගොඩ බිම් ප්‍රහාරයක් දියත් කලේ ය. අවට ප්‍රදේශවල දහස් ගනන් සුලු ගොවීන්ට ජල සැපයුම කපා හරිමින්, සොරොව් දොර වසා දැමීම ගැන ආන්ඩුව එල්ටීටීඊයට චෝදනා කර තිබේ.

මෙහෙයුම අතිශයින් ම සීමිත එකක් වනු ඇතැයි ද එය පැය 24කින් අවසන් වනු ඇතැයි ද යනුවෙන් ආන්ඩුව කල කියාපෑම් තිබිය දී ම, මිලිටරිය සොරොව්වේ පාලනය අල්ලා ගැනීමට අසමත්ව ඇත. දැඩි මිලිටරි වාරනයක කොන්දේසි යටතේ, තියුනු සටන පිලිබඳ වාර්තා සීමිත හා පක්ෂපාතී ස්වරූපයක් ගෙන තිබේ. කෙසේ වෙතත්, සඳුදා තම සොල්දාදුවන් 27ක් අහිමි වූ බව පිලිගත් හමුදාව කැරලිකරුවන් 39ක් මරා දැමූ බව ද කියාපෑවේ ය. මෙම කියාපෑම එල්ටීටීඊය ප්‍රතික්ෂේප කර ඇත.

හමුදාව සිය ප්‍රහාරක මෙහෙයුමට අමතර භටයන් හා උපකරන එකතු කිරීමට ක්‍රියා කර ඇති තතු යටතේ ගැටුම ශීඝ්‍රයෙන් පැතිරෙමින් පවතී. සඳුදා හැන්දෑවේ ප්‍රදේශය තුල හමුදා භටයන් ප්‍රවාහනය කරමින් සිටි බස් රථයක් ඉලක්ක කර ගෙන බිම් බෝම්බයක් පුපුරුවා හැරීමට එල්ටීටීඊය කටයුතු කලේ ය. අඩු ගනනේ සොල්දාදුවන් 15ක් හා සිවිල් රියදුරා ප්‍රහාරයෙන් මිය ගිය බව මිලිටරිය පිලිගෙන තිබේ. එයින් තවත් බොහෝ ගනනක් තුවාල ලැබී ය.

මිලිටරිය එල්ටීටීඊ ඉලක්කවලට බෝම්බ හා වෙඩි වරුසා එල්ල කිරීමට කාල තුවක්කු, මල්ටි-බැරල් රොකට් විදින සහ ඊස්රායලයේ තනන ලද කෆීර් යුද ගුවන් යානා යොදා ගනිද්දී ඊයේ ගැටුම තව දුරටත් ඉදිරියට ගියේ ය. සොරොව්වේ සිට කිලෝ මීටරයක් දුරින් පිහිටි සීමාවට ඇතුලු වීමට තමන් සමත්ව ඇතැයි හමුදාව කියාපායි.

හමුදා ප්‍රකාශක බ්‍රිගේඩියර් ප්‍රසාද් සමරසිංහ රාජ්‍යය සතු ඩේලි නිව්ස් පත්‍රයට මෙසේ පැවසී යඃ "ආරම්භයේ දී සොරොව්ව දෙසට පාබල හමුදාවන් ගමන් කිරීමේ වේගය අඩු කරන ලද්දේ බිම් බෝම්බ මගිනි. දැන් මිලී මීටර් 81 හා මිලී මීටර් 120 මෝටාර් යොදා ගනිමින් එල්ටීටීඊය විසින් එල්ල කරනු ලබන මෝටාර් ප්‍රහාර ඉදිරියට යන හමුදා භටයන්ගේ ප්‍රගතියට බාධා කරයි.

පවත්නා සෘජු වාර්තා කිහිපයෙන් එකක් අද ඩේලි *මිරර්* පත්‍රයේ පලව තිබූ අතර එය තත්වය විස්තර කරන තුවාල ලැබූ සොල්දාදුවකු උපුටා දක්වා තිබුනි. 200ක පමන "කොටි" හමුදාවක් සොරොව්ව අසල දෘඪතර ලෙස ඇලී ගැලී සිටි බව ඔහු පැවසී ය. "මිය ගිය එල්ටීටීඊ භටයන්ගේ සිරුරු 40ක් පමන" ප්‍රදේශය වටා විසිර ඇති අයුරු ඔහු දැක තිබේ. සෙසු එල්ටීටීඊ සටන්කරුවන්ගේ හිරිහැරයන්ට මිලිටරිය නැවත නැවතත් ලක්ව ඇත. "කන්ඩායම හිටිහැටියේ පෙනී සිට, ඉදිරියට එන හමුදා භටයන් වෙත වෙඩි ප්‍රහාර එල්ල කොට වහාම නොපෙනී ගියා" යැයි ඔහු පැවසී ය.

වෙනත් ප්‍රදේශවල ද ගැටුම් සිදුව ඇත. උතුරේ යාපන අර්ධද්වීපයේ සිට ත්‍රිකුනාමලය දක්වා හමුදා භටයන් 850කට වඩා ප්‍රවාහනය කිරීමට යොදා ගන්නා මගී නෞකාවක් වන ජෙට්ලයිනර්, ඊයේ වරායට සෘජුව ම විරුද්ධ පැත්තේ පිහිටි සාම්පූර් ප්‍රදේශයේ එල්ටීටීඊ මධ්‍යස්ථානවල සිට එල්ල වූ කාල තුවක්කු හා මෝටාර් ප්‍රහාරයන්ට ලක් විය. ජෙට්ලයිනර් නිරුපද්‍රිතව වරායට සේන්දු වූ අතර ප්‍රහාරයෙන් නාවිකයන් සිවු දෙනෙක් ඝාතනයට ලක්ව තවත් 30කට තුවාල සිදු විය. සාම්පූර් ප්‍රදේශයට වෙඩි ප්‍රහාර එල්ල කිරීම මගින් මිලිටරිය එයට ප්‍රතිචාර දැක්වී ය.

පූර්න පරිමාන යුද්ධයක් ඇවිලීම පිලිබඳ භීතිය ත්‍රිකුනාමල දිස්ත්‍රික්කයෙන් පලා යන වැඩෙන සරනගත ප්‍රවාහයක් නිර්මානය කර තිබේ. "ඔවුන් තමන්ට අයිති බඩු භාන්ඩ අරගෙන යනවා. ඒත් ඔවුන්ට යන්න නියම තැනක් නැහැ." යැයි නිර්නාමික මූලාශ්‍රයක් බීබීසීයට පැවසී ය. "සටන් පවතින්නෙ කිලෝ මීටර් 20ක් එහායින්. ඒත් සෑම කෙනෙක්ම බයෙන් ඉන්නෙ ප්‍රචන්ඩ ක්‍රියා නගරය දෙසටත් පැතිරේවි කියල. දැන් ඔක්කොම කාර්යාල වසා දමල. මිනිස්සු දන්නෙ නැහැ මොකක්ද සිද්ධ වෙන්නෙ කියල. එහි යුද්ධයක් යනව. සටන් පවතිනව. ඒක ඉතා දරුනුයි. මට හැඟෙන පරිදි ජීවිත හානි ඉහල යාවි."

සෙසු නාවික ගැටුම් පිලිබඳව එකිනෙකට පරස්පර විරෝධී මාධ්‍ය වාර්තා පල වී ඇත. ඊයේ තමන් නාවික හමුදාවේ වේගවත් ප්‍රහාරක යාත්‍රාවක් ගිල්වා දැමූ බව එල්ටීටීඊය කියාපෑවේ ය. එහෙත් මිලිටරිය වහාම එම වාර්තාව ප්‍රතික්ෂේප කලේ ය. නාවික හමුදාව ත්‍රිකුනාමල ප්‍රදේශයේ දී අඩු ගනනේ එල්ටීටීඊයේ කුඩා ප්‍රහාරක බෝට්ටු තුනක් ගිල්වා දමා තවත් ගනනාවකට හානි කල බව ආරක්ෂක ප්‍රකාශක අවධාරනය කලේ ය.

ප්‍රාදේශීය ගොවි ජනතාවට ජලය සැපයීම පිනිස මාවිල්ආරු සොරොව් දොරටුව විවෘත කිරීමේ සීමිත, "මානුෂික" මෙහෙයුමක තමන් යෙදී සිටින බවට ආන්ඩුව කරන කියාපෑම් පචයක් බව ගැටුම ශීඝ්‍ර ලෙස පැතිර යාමෙන් පෙන්නුම් කෙරෙයි. 2002 සටන් විරාම ගිවිසුම පැහැදිලිව උල්ලංඝනය කරමින්, එල්ටීටීඊ භූමි ප්‍රදේශ අල්ලා ගනු පිනිස ප්‍රහාරක මෙහෙයුමක් දියත් කිරීමත් එමෙන් ම මාවිල්ආරු අසලක වත් නොපිහිටි එල්ටීටීඊ ඉලක්ක වෙත බෝම්බ දැමීමත් සඳහා කඩතුරාවක් ලෙස මිලිටරිය මෙම සිද්ධිය ගසාකා ඇත.

සෙනසුරාදා, ගුවන් හමුදාව මඩකලපුවේ සිට කිලෝ මීටර් 24ක් වයඹ දෙසින් පිහිටි කරදියනාරුහි එල්ටීටීඊ සම්මන්ත්‍රන ශාලාවකට බෝම්බ ප්‍රහාරයක් එල්ල කලේ ය. සඳුදා, සිය ප්‍රහාරක යානා වාකරෙයි ප්‍රදේශයේ එල්ටීටීඊ නාවික කඳවුරකට පහර දී අඩු ගනනේ එල්ටීටීඊ සාමාජිකයන් 30ක් මරා දැමූ බව මිලිටරිය නිවේදනය කලේ ය.

එල්ටීටීඊයට අනුව, කොලඹ ආන්ඩුව මාවිල්ආරු ප්‍රදේශයේ වැවක් තැනීමේ දිගු කාලීන සැලසුම් මීට මාසයකට ඉහත දී අතහැර දැමීමෙන් පසුව පැන නැගි මෙම ජල ප්‍රශ්නය විසඳීමට ආන්ඩුවට කිසිදාක උනන්දුවක් තිබුනේ නැත. ප්‍රදේශයේ වැසියෝ සොරොව්ව වසා දැමීම මගින් විරෝධය පල කොට ඉල්ලීම් මාලාවක් ඉදිරිපත් කලහ. සටන් විරාමය අධීක්ෂනය කරන නෝර්වේජියානු නායකත්වයෙන් යුත් ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂන කමිටුව (එස්එල්එම්එම්), විසඳුමක් පිලිබඳ සාකච්ඡා කරනු වස් ජූලි 27 දා එල්ටීටීඊය හා ප්‍රදේශයේ ගොවීන් හමුවීමට නියමිතව තිබුනි. එහෙත් ඊට පෙර හැන්දෑවේ බෝම්බ ප්‍රහාරය අරඹන ලෙස ආන්ඩුව අන කලේ ය.

සඳුදා කොලඹ දී ප්‍රකාශයක් කල එස්එල්එම්එම් ප්‍රධානි මේජර් උල්ෆ් හෙන්රික්සන්, මෙසේ ප්‍රකාශ කරමින්, ආන්ඩුවේ "මානුෂික එල්ලයන්" ප්‍රසිද්ධියේ ප්‍රශ්න කලේ ය: "ඉලක්කන්තෙයි මුහුදු කොටි කඳවුරට බෝම්බ දැම්මෙ ජලය වෙනුවෙන් නෙවි." එල්ටීටීඊය ජලාශය පුපුරා දැමීමට තීන්දු කල හොත්, මාවිල්ආරු සොරොව්ව අල්ලා ගැනීමේ ප්‍රහාරක මෙහෙයුම අනිසි ප්‍රතිඵල ගෙන ආ හැකි බව ද ඔහු පෙන්වා දුන්නේ ය. ප්‍රහාරක මෙහෙයුම "ආන්තිකව පමන ඉක්මවා යාමක්" ලෙස ද ගැටලුව ජලය ලබා ගැනීම නම් ඒ සඳහා යොදා ගත් වැරදි විධි ක්‍රමයක් ලෙස ද ඔහු ගුනාංගීකරනය කලේ ය.

*හින්දුස්ථාන් ටයිම්ස්* පත්‍රයට ප්‍රකාශයක් කල බටහිර තානාපති නිලධාරියෙක් ද ඊට සමාන සංශයවාදී අදහසක් ඉදිරිපත් කලේ ය: "ගැටලුව ජලය නම්, වේල්ල අල්ලා ගත යුතු නම්, හොඳම ක්‍රමය ලෙස තිබුනේ එක ඉක්මන් මෙහෙයුමකින් එම ස්ථානය අල්ලා ගනු පිනිස හෙලිකොප්ටරයකින් කොමාන්ඩෝ භට පිරිසක් බස්සවා එය අවසන් කිරීමයි." යැයි ඔහු පැවසී ය.

එස්එල්එම්එම් වඩ වඩාත් අසීරු තත්වයකට පත්ව ඇත. ආන්ඩුව සටන් විරාම ගිවිසුමෙන් ඉවත් වී නැති අතර එහි කොන්දේසිවලට තමන් බැඳී සිටින බව දිගට ම අවධාරනය කරයි. එහෙත් මහින්ද රාජපක්ෂ ජනාධිපති තනතුර ජයගත් අවස්ථාවේ සිට මේ දක්වා පසු ගිය මාස නවයකට වැඩි කාලයක් තිස්සේ, මිලිටරිය හා එයට බැඳුනු එල්ටීටීඊ විරෝධී පැරා මිලිටරි කන්ඩායම් එල්ටීටීඊය ප්‍රකෝප කිරීමේ හා එයට වල කැපීමේ රහස් යුද්ධයක් ගෙන ගොස් ඇත. වත්මන් මිලිටරි ප්‍රහාරක මෙහෙයුම පූර්න පරිමාන සිවිල් යුද්ධය යලි ඇවිලීම පිනිස වේදිකාව සකසමින් සිටී.

සඳුදා හෙන්රික්සන් අශුභවාදී ලෙස පුවත්පත්වලට මෙසේ කියා සිටියේ ය: "යථාර්ථය තුල සටන් විරාමයක් නැත. එහෙත් ලිඛිතව එය තවමත් බල පවත්වයි. මේ මොහොතේ එක පාර්ශ්වයක් වත් සාකච්ඡා කිරීම ගැන උනන්දු නැත. . . . පූර්න පරිමාන යුද්ධයක් ව්‍යසනයක් වනු ඇත."

ශ්‍රී ලංකාවේ මිලිටරි ප්‍රහාරක මෙහෙයුම සම්බන්ධයෙන් ජාත්‍යන්තර ක්ෂේත්‍රයේ නිශ්ශබ්දතාවක් පැවතීම අර්ථභාරී ය. ශ්‍රී ලංකාවේ සටන් විරාම ගිවිසුම අඛන්ඩව පැවතීමට ද සාකච්ඡාමය සාම සම්මුතියකට ද තමන් සහයෝගය දෙන බවට කරන ඔවුන්ගේ කියාපෑම් තිබිය දී ම, එක්සත් ජනපදය, ඉන්දියාව, යුරෝපා බලවතුන් හා ජපානය රාජපක්ෂ ආන්ඩුවේ ක්‍රියාවන් හෙලා දැකීම

තබා ඒ ගැන එක වචනයකින් වත් විවේචනය කර නැත.

මෑත මාස ගනනාව තුල එක්සත් ජනපදයේ වැඩකටයුතුවල ප්‍රතිඵලය වී ඇත්තේ, එල්ටීටීඊයට එරෙහිව ආක්‍රමනශීලී ආස්ථානයක් ගනු පිනිස රාජපක්ෂ ආන්ඩුවට කොල ආලෝක සංඥාව නිකුත් කිරීම යි. බුෂ් පාලනාධිකාරය 2002 සටන් විරාමයටත් ඉන් අනතුරුව ඇරඹි සාම සාකච්ඡාවලටත් පිටුබලය සැපයුවේ, ශ්‍රී ලංකාවේ මහජනතාව කෙරෙහි පවත්නා මොන යම් උත්සුකතාවකින් නොව, ඉන්දියානු උප-මහාද්වීපයේ එක්සත් ජනපද ආර්ථික හා මූලෝපායික අවශ්‍යතාවන්ට තර්ජනය කරන ගැටුමක් අවසන් කරනු පිනිස ය. 2003 දී සාම සාකච්ඡා අසාර්ථක වීමෙන් පසුව, විශේෂයෙන් ම පසු ගිය නොවැම්බරයේ දී රාජපක්ෂ තේරී පත්වීමෙන් පසුව, වොෂිංටනය, එල්ටීටීඊය තලා දැමීම හෝ යටත් වන ලෙස එයට බල කරනු පිනිස එල්ටීටීඊයට එරෙහි මිලිටරි ක්‍රියාවන් උත්සන්න කිරීමට වක්‍රව සහයෝගය දී තිබේ.

බුෂ් පාලනාධිකාරය එල්ටීටීඊය "ත්‍රස්තවාදී සංවිධානයක්" ලෙස තහනම් කරන ලෙස කැනඩාවට හා යුරෝපා සංගමයට බලපෑම් කිරීමේ ජාත්‍යන්තර රාජ්‍යතාන්ත්‍රික ව්‍යායාමයක් ගෙන ගොස් ඇත. ලොව වටා වෙසෙන දෙමල සංක්‍රමනික ප්‍රජාව අතරින් ලැබෙන මූල්‍ය හා දේශපාලන සහයෝගය රඳා පවතින එල්ටීටීඊයට මෙම පියවර මගින් දරුනු පහරක් එල්ල විය.

එස්එල්එම්එම් තුල සිටින යුරෝපා සංගමයේ සාමාජිකයන් -- ෆින්ලන්තය, ස්වීඩනය හා ඩෙන්මාර්කය -- යුරෝපා සංගමයේ නොවන සාමාජිකයන්ගෙන් විස්ථාපනය කල යුතු යැයි එල්ටීටීඊය අවධාරනය කරන බැවින්, ඉහත තීන්දුව සටන් විරාම ගිවිසුම යලි පන ගැන්වීමට නෝර්වේ දරන ප්‍රයත්නයන්ට සෘජුව ම වල කපා ඇත. පසු ගිය සතියේ ෆින්ලන්තය හා ඩෙන්මාර්කය එස්එල්එම්එම් සාමාජිකත්වයෙන් තමන් ඉවත් වන බව නිවේදනය කල අතර ස්වීඩනය ද මෙම සතියේ එම පිලිවෙත අනුගමනය කලේ ය. වඩ වඩා අර්ථ විරහිත තත්වයට පත් වන සටන් විරාමයක් අධීක්ෂනය කරන, සෝදා පාලුවට ලක්ව ඇති කමිටුවක් එකට මාට්ටු කර තබා ගැනීමේ කර්තව්‍යය, එම පියවර මගින්, නෝර්වේ හා අයර්ලන්තය මත පමනක් පැටවෙනු ඇත.

ඉරිදා සටන් උත්සන්න වීමත් සමග ම, ත්‍රිකුනාමලයේ ජ්‍යෙෂ්ඨ එල්ටීටීඊ නායකයකු වන එස්. එලිලන් මාධ්‍යවලට කියා සිටියේ, සටන් විරාම ගිවිසුම "ශූන්‍ය හා හිස්" දෙයක් බවට පත්ව ඇති බව යි. "යුද්ධය සිදු වෙමින් පවතී, අපි එයට සූදානම් ය. යුද්ධය ඇරඹී ඇත. යුද්ධය අරඹා ඇත්තේ ආන්ඩුව යි" යැයි ඔහු පැවසී ය. කෙසේ වෙතත්, පසු දින ඔහු සිය ප්‍රකාශයේ සැර බාල කරමින් පැවසුවේ, සටන් විරාම ගිවිසුමෙන් ඉවත් වීම පිලිබඳ මොන යම් හෝ තීන්දුවක් ගත යුත්තේ උතුරේ කිලිනොච්චි නගරය පදනම් කර ගෙන ක්‍රියාත්මක වන එල්ටීටීඊ නායකත්වය බව යි.

එල්ටීටීඊය උගුලකට හසුව ඇත. එය 2002 සටන් විරාමයට එකඟ වී දෙමල ඊලාම් වෙනම රාජ්‍යයක් පිලිබඳ සිය දිගු කාලීන ඉල්ලීම ආකාරගතව අතහැර දැමීමේ කොලඹ ආන්ඩුව සමග බලය බෙදා ගැනීමේ සම්මුතියකට එලඹීමේ අපේක්ෂාවෙනි. එවන් එකඟතාවක් පිලිබඳ කිසිදු කතාවකින් තොරව 2003 දී සාකච්ඡා බිඳ වැටීමෙන් පසුව, සාකච්ඡාවලට ආන්ඩුව යලිත් තල්ලු කරන ලෙස එල්ටීටීඊය "ජාත්‍යන්තර ප්‍රජාවට" නැවත නැවතත් ආයාචනා කලේ ය. කෙසේ වෙතත්, දැන් වඩ වඩාත් පැහැදිලි වී ඇත්තේ, එක්සත් ජනපදය හා මහ බලවතුන් අවධාරනය කරන්නේ සාකච්ඡා මොන යම් ආකාරයකින් හෝ යලි ඇරඹීමට පෙරාතුව එල්ටීටීඊය මුලුමනින් ම යටත් වීමට වඩා නොඅඩු දෙයක් බව යි.

පසු ගිය මාස නවයක කාලය මුලුල්ලේ රාජපක්ෂ ආන්ඩුවේ ප්‍රකෝපකාරී මිලිටරි පියවරයන් දුවවනු ලබන්නේ, වැඩෙන ආර්ථික හා සමාජ අර්බුදයක් මගිනි. වාර්ගික වෛරය ඇවිලවීම සහ දැනටමත් ජීවිත 65,000ක් බිලි ගෙන තිබෙන සිවිල් යුද්ධයක් කරා රට යලි ඇද දැමීම හැර වෙනත් විසඳුමක් මෙම අර්බුදය සම්බන්ධයෙන් රාජපක්ෂ ආන්ඩුවට නැත. දුගී ගොවීන් දහස් ගනනකට ජලය සැපයීමේ "මානුෂික මෙහෙවරක්" ලෙස මිලිටරි ආක්‍රමනය යුක්තියුක්ත කිරීමට රාජපක්ෂගේ සිංහල ස්වෝත්තමවාදී සගයන් -- ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය -- ද මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ද ගෙන යන උමතු ව්‍යායාමයක් සමග දිවයිනේ නැගෙනහිර සිදු කෙරෙන ප්‍රහාරක මෙහෙයුම එකට අත්වැල් බැඳගෙන ඇත.

යුද්ධය යලි ඇවිලවීම හුදෙක් එල්ටීටීඊයට හා දෙමල ජනතාවට පමනක් නොව, සමස්තයක් ලෙස වැඩ කරන ජනතාවට ම එරෙහිව එල්ල වී ඇත. ත්‍රිකුනාමල දිස්ත්‍රික්කයේ ගොවීන් පිලිබඳ උත්සුකතාව ප්‍රකාශ කරන ආන්ඩුව ම ගම්බද ප්‍රදේශවල පුලුල්ව පැතිර පවත්නා ආන්තික දරිද්‍රතාව තුනී කරනු වස් කිසිවක් කර නැත. මීට යන්තම් සති තුනකට ඉහත දී, සමහර මාධ්‍ය, "එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට" වඩා හානියක් සිදු කරන්නන් ලෙස වරාය හා ඛනිජ තෙල් කම්කරුවන් හෙලා දැක සියලු කාර්මික ක්‍රියාවන් නතර කරනු වස් දැඩි පියවර ගන්නා ලෙස ආන්ඩුවෙන් ඉල්ලා සිටියහ. "ජාතියේ ආරක්ෂාව" වෙනුවෙන් කැප කිරීම් කරන ලෙස කම්කරුවන්ගෙන් හා දුගීන්ගෙන් තව දුරටත් කෙරෙන ඉල්ලීම් යුද්ධය සමග නොවැලැක්විය හැකි ලෙස ඉස්මත්තට පැමිනෙනු ඇත.

© www.wsws.org